ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **සන්නිවේදන දෙපාර්තමේන්තුව** |
| දිනය | **2014 නොවැම්බර් 01** |

**මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම පිළිබඳ යාවත්කාලීන කිරීම: 2014 ඔක්තෝබර්**

2014 ඔක්තෝබර් මාසය තුළදී, බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් (බැංකු නොවන මූල්‍ය ආයතන), මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියෙහි වැඩිදුර ප්‍රගතියක් අත්පත්කර ගත්තේය.

- ඩීඑෆ්සීසී බැංකුව, නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී සහ ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී යන බැංකු ත්‍රිත්වය අතර යෝජිත ඒකාබද්ධ කිරීම සඳහා පහසුකම් සලසන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලදී. 2014 අයවැය මගින් අපේක්ෂා කළ පරිදි, සංවර්ධන බැංකුකරණය කෙරෙහි යොමු වූ ශක්තිමත් බැංකුවක් පිහිටුවීමේ අරමුණින්, මෙකී බැංකුවල මෙහෙයුම් කටයුතු ඒකාබද්ධ කිරීම මනා ලෙස සිදුකිරීම සඳහා ඒකාබද්ධ අභ්‍යන්තර කමිටු සම්පව ක්‍රියාකරන ලදී.

- තවද, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී, එම්සීඑස්එල් ෆයිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ් සහ එම්බීඑස්එල් සේවිංග්ස් බෑන්ක් ලිමිටඩ් අතර යෝජිත ඒකාබද්ධ කිරීමට අදාළ කටයුතු සම්පූර්ණ කිරීමේ අවසන් අදියරට ළඟා වී ඇත. ඒ සඳහා අවශ්‍ය කොටස්හිමියන්ගේ අනුමැතිය මේ වනවිට ලබාගෙන ඇති අතර, ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව පිහිටුවනු ලබන ආයතනය බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ලෙස ක්‍රියාත්මක වනු ඇත.

- ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය යටතේ, අත්පත්කර ගැනීමේ/ඒකාබද්ධ කිරීමේ පිරිවැය සුදුසුකම් ලැබීමේ ගෙවීම් වශයෙන් නිර්ණය කිරීමට සහ අන්තර්ග්‍රහණය නොකළ සියලු යෙදවුම් සඳහා බැරකම් මත හිමිකම්පෑමට පිළිවෙලින්, දේශීය ආදායම් පනතේ සහ එකතු කළ අගය මත බදු පනතේ නියමයන්ට අනුකූලව මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

මෙම මාර්ගෝපදේශ බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් සඳහා 2014 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙනු ඇත. මෙම මාර්ගෝපදේශයන්, අඛණ්ඩ පැවැත්මක් සහිත ඒකකයක් ලෙස ව්‍යාපාරයක් අත්පත්කර ගැනීම හෝ කොටස් අත්පත්කර ගැනීම හෝ වෙනත් බැංකුවක්/මූල්‍ය සමාගමක්/කල්බදු සමාගමක් සමඟ ඒකාබද්ධවීම හෝ සම්බන්ධ පිරිවැය අයිතමයන් නියම කරයි. මෙම සහන, මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රවර්ධනයට සහ බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම්වල දැනටමත් සිදුවෙමින් පවතින ඒකාබද්ධ කිරීමේ සහ අත්පත්කර ගැනීමේ ක්‍රියාමාර්ගයන් කඩිනමින් සම්පූර්ණ කිරීමට මනා පිටුවහලක් සපයනු ඇතැයි අපේක්ෂිතය.

- සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී සමඟ ඉසුරු ලීසිං කම්පැනි ලිමිටඩ් සහ ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී සමඟ ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී විසින් එකඟ වූ ඒකාබද්ධවීම් වලට අදාළ සැලසුම් පිළිබඳව මහජන නිවේදන 2014 ඔක්තෝබර් මාසය තුළදී නිකුත් කරන ලදී. ඒකාබද්ධ කිරීමේ සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව තෝරාගත් බැංකු නොවන මූල්‍ය ආයතන කිහිපයක් සමඟ සාකච්ඡා පැවැත්වීය. මේ වනවිට, බැංකු නොවන මූල්‍ය ආයතන 41 ක් සහ බැංකු 9 ක් ඔවුන්ගේ ඒකාබද්ධ කිරීමේ සැලසුම් තහවුරු කර ඇත. මේ අතරින්, බැංකු නොවන මූල්‍ය ආයතන 8 ක් සහ බැංකු 2 ක් ඔවුන්ගේ ඒකාබද්ධ කිරීමේ සැලසුම්වල කටයුතු නිමකර ඇති අතර, බැංකු නොවන මූල්‍ය ආයතන 33 ක් සහ බැංකු 7 ක් තවමත් ඔවුන්ගේ ඒකාබද්ධ කිරීමේ සැලසුම්වල විවිධ අදියර ඉදිරියට ගෙන යාමේ නිරතව සිටී. මෙකී ඒකාබද්ධ කිරීමේ සැලසුම් ක්‍රියාවට නැංවීමෙහි ප්‍රගතිය ශ්‍රී ලංකා මහ බැංකුව සමීපව නිරීක්ෂණය කරයි.